# සඟමිත් රහත් තෙරණියගේ ශ්‍රී ලංකා ගමනය හා බුදුදහමේ ව්‍යාප්තිය

කේ. ඒ. අයි. ඒ. ද. ඒ. ගුණසේකර[1]

බුදුන්වහන්සේ විසින් කාන්තාවට ලබා දුන් අපරිමිත නිදහස හේතුවෙන් ඇයට සමාජයේ පුරුෂයා මෙන් සුවිශේෂී චරිතයක් ලෙස ඉස්මතු වීමට හැකිවිය. දියණියක, ගෘහණියක, බිරිඳක හා මවක ලෙස බහුවිධ චරිත නිරූපණය කළ කාන්තාව බුදු දහම ලැබීමත් සමග භික්ෂුණියක, උපාසිකාවක ලෙස දසවිධ කුසල කර්මයන් සිදු කරමින් සැදැහැවත් ජීවිතයක් ගත කරන්නට යොමුවිය. විශේෂයෙන්ම තෙවන ධර්ම සංගායනාවෙන් පසු රටවල් නවයකට බුදුදහමේ පණිවුඩය යැවූ අතර එමගින් ශ්‍රී ලංකාව ඇතුළුව ආසියාකරයේ රටවල් කිහිපයක බුද්ධ ශාසනය ස්ථාපිත කරනු ලැබීය. මෙලෙස බුදුදහමේ පණිවුඩය ශ්‍රී ලංකාවට ලැබුණා සේම එය තවදුරටත් ව්‍යාප්ත කිරීමේ අරමුණින් අශෝක රජුගේ දියණිය වූ සංඝමිත්තා රහත් තෙරණිය දඹදිව බුද්ධගයාවේ පිහිටි ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාවක් ද රැගෙන උඳුවප් පුන් පොහෝ දිනක දිවයිනට වැඩම කරවන ලදී. මේ සමග ශ්‍රී ලාංකේය භික්ෂුණී පර්ෂදය ආරම්භ වූ අතර පුරුෂ පක්ෂයට සීමාවී පැවති ශාසනය කාන්තාවට ද විවර විය.

මෙලෙස භික්ෂුණී පර්ෂදය පිහිටුවීම කාන්තාවට පමණක් ලැබුණු වරප්‍රසාදයක් පමණක් නොව එය සමස්ත ශ්‍රී ලාංකේය සමාජය තුළ බුදු දහම ව්‍යාප්ත වීමේ අඩියරයක් ද විය. එක් පැත්තකින් මිහිඳු මහරහතන් වහන්සේගේ ධර්ම ප්‍රචාරය හේතුවෙන් ලක්දිව දසත භික්ෂු, උපාසක, උපාසිකා යන තෙවනක් පිරිසක් ඇතිවූ අතර මෙම පිරිස සංඝමිත්තා තෙරණියගේ ආගමනයෙන් පසු අනුලා දේවි ඇතුළු දහසක් ස්ත්‍රීන් සංඝමිත්තා භික්ෂුණීන් සමීපයේ මහණවීමත් සමග භික්ෂුණී පර්ෂදය ආරම්භ වීමෙන් සිවුවනක් පිරිසක් බවට පත්විය. සිංහල බෝධිවංශයේ දැක්වෙන ආකාරයට සඟමිත් තෙරණිය හා සිය පිරිවර විසින් දහස් ගණනක් මාගමුන් මහණ කරවා සික්ඛමාන සාමණේරීන් උපසම්පදා කරවා අධිශීල, අධිචිත්ත, අධිප්‍රඥා සංඛ්‍යාත ආදී ත්‍රිවිධ ශික්ෂායෙහි හික්මවා සර්වඥ ශාසනය වර්ධනය කළහ. මේ ආකාරයට අතීතයේදී ශ්‍රී ලංකාව තුළ බුදු දහම ව්‍යාප්ත කිරීම උදෙසා විශාල කාර්යභාරයක් භික්ෂුණී පර්ෂදය පිහිටුවීම හා එහි ව්‍යාප්තියත් සමග සිදු වූ අතර ලක්දිව දසත බෞද්ධාගමික ජීවිතයක් ගත කරන පිරිසක් ඇති විය. පුරාතන අවධියේදී ශ්‍රී ලංකාව තුළ භික්ෂුණීන් දහස් ගණනක් සිටි බව ප්‍රාථමික

1 ඉතිහාස අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය,
isharagunasekara123456@gmail.com

මූලාශ්‍රගත තොරතුරු අනුව පැහැදිලි වේ. ඒ අතරින් මහාවංසය සඳහන් කරන ආකාරයට මහාථූප පූජෝත්සවයට භික්ෂුණීන් 14,000ක් සහභාගී වී තිබේ. එමෙන් ම එම භික්ෂුණීන් රහත් වූ තෙරණියන් බව ද එහි ම දැක්වේ. මිරිසවැටි චෛත්‍යයේ කොත් පළන්දවන පූජෝත්සව අවස්ථාවේදී රැස් වූ පිරිස අතර භික්ෂුණීන් 95,000ක් සිටි බව ථූපවංසයේ සඳහන් වේ. එමෙන්ම මහසිළුමහතිස් රජතුමා විසින් භික්ෂුණීන් 12,000කට තුන් සිවුරු සපයා දුන් බව මහාවංසයේ දැක්වේ. අතීතයේ දී රාජ මෙහෙසියගේ සිට සාමාන්‍ය ගැමි කාන්තාව දක්වා භික්ෂුණී පර්ෂදයට ඇතුළත්ව බුදු දහම ලක්දිව දසත ප්‍රචලිත කිරීම උදෙසාත් සාරගර්භ සහිත සමාජයක් බිහි කරලීම උදෙසාත්, දායකත්වයක් දැක්වූ භික්ෂුණී සමාජයේ සීඝ්‍ර දියුණුව කොතෙක්ද යත් ලාංකේය භික්ෂුණීන් විදෙස් රටවල පවා ධර්ම ප්‍රචාරක කටයුතුවල නියැලීම දැක්විය හැකිය. නිදසුන් ලෙස නාගර්ජුනී කොණ්ඩ නමැති ස්ථානයෙන් සොයාගත් සංස්කෘත ශිලා ලිපියක ධර්ම ප්‍රචාරයෙහි යෙදුණු සිංහල භික්ෂුණීන් ගැන වන සඳහන දැක්විය හැකිය. එසේම රට පාලනය කළ රාජ මහාමාත්‍යවරුන්ගේ විශේෂ අනුග්‍රහය භික්ෂුණී සමාජය වෙනුවෙන් ලැබීම ද වැදගත් කරුණකි. නිදසුනක් ලෙස දේවානම්පියතිස්ස රජු විසින් දහසකට අධික භික්ෂුණීන් පිරිසකට වාසය සඳහා චූලංගන, මහංගන හා සිරිවඩ්ඪන යන ප්‍රාසාද තුන ඇතුළු ප්‍රාසාද දොළසක් භික්ෂුණී ආවාස ලෙස සූදානම් කර සංඝමිත්තා භික්ෂුණීන් වහන්සේට පූජා කිරීම දැකවිය හැකිය. මීට අමතරව උපාසිකා විහාරය, හත්ථාළ්හක මෙහෙණවර, මාතු විහාරය, දන්තගේහ තිස්සාරාමය, මහින්දාරාමය, නාලාරාමය, සිලාමේඝ විහාරය ආදි විවිධ වූ මෙහෙණවරවල වැඩ සිටි භික්ෂුණීන් සර්වඥ ශාසනය වර්ධනය උදෙසා කටයුතු කළ සේක. මේවායෙහි වැඩසිටි භික්ෂුණීන් රාජකීය හා කුල කාන්තාවන්ට අධ්‍යාපනය ලබා දීම, ධර්ම දේශනා කටයුතුවල නිරතවීම වැනි කටයුතුවල නිරත වෙමින් බුදුදහමේ චිරස්ථිතිය උදෙසා කටයුතු කරන ලදී. එසේම අර්හත් මාර්ගඵල හා මහත් යශස් ඇති භික්ෂුණීන් විශාල ප්‍රමාණයක් ද රුහුණු දනව්වේ සිටි බව දීපවංසයේ සඳහන් වේ. මෙලෙස අතීතයේ භික්ෂුණී පර්ෂදයේ පැවති තත්ත්වය මගින් බුදු දහම සීඝ්‍ර ලෙස දිවයිනේ මෙන්ම අනෙකුත් රටවල ද ප්‍රචලිත වීමට හේතු වූ බව පැහැදිලි වේ. නමුත් වර්තමානය වනවිට මෙම තත්ත්වය සීඝ්‍ර ලෙස පරිහානියට පත්ව ඇති බව පෙනී යන කරුණකි. අනුරාධපුර යුගය භික්ෂුණී පර්ෂදයේ ස්වර්ණමය යුගය වූයේ නමුත් එය හතරවන මහින්ද රජුගේ කාලයෙන් පසු විවිධ හේතු සාධක රැසක් බලපෑමෙන් පරිහානියට පත් විය. මින්පසුව භික්ෂුණීන් පිළිබඳව හෝ මෙහෙණවර පිළිබඳව මහාවංසයෙන් තොරතුරු හමු නොවේ. විශේෂයෙන් ජේතවනාරාම සෙල්ලිපියට අනුව මෙම කාලය වනවිට ඇතැම් භික්ෂුණී ආරාම ගරා වැටෙමින් පැවති බවත් මිහිඳු රාජ්‍ය සමයේදී ඒවා අලුත්වැඩියා කළ බවත් ''අසරණ මෙහෙණි ගණා මෙහෙණිවර නවකම් කරා'' යනුවෙන් ඇති අභිලේඛන පාඨයෙන් පැහැදිලි වේ. ඒ අනුව දසවන සියවස අගභාගය වනවිට භික්ෂුණී පර්ෂදයේ පෙර පැවති ශ්‍රී විභූතිය



BHIKSHU UNIVERSITY OF SRI LANKA
27 APR 2015

නැතිවී ගොස් පරිහානි තත්ත්වයක් කරා ගමන් කරනු ලැබීය. මෙය වර්තමානය වනවිටත් තවදුරටත් දැකිය හැකිය. වර්තමාන ශ්‍රී ලංකාව තුළ භික්ෂුණී පර්ෂදයක් දැකගත නොහැකි තරම්ය.

මෙම පසුබිමේ සිට කරගෙන යනු ලබන මෙම පර්යේෂණයේ මුඛ්‍ය අරමුණ වනුයේ අතීත ශ්‍රී ලංකාව තුළ බුදු දහම ව්‍යාප්ත කරලීම සඳහා භික්ෂුණී පර්ෂදය පිහිටුවීමෙන් ලැබුණු දායකත්වය කෙබඳුවී ද යන්න පිළිබඳ ඓතිහාසික මූලාශ්‍ර පරිශීලනය කරමින් විමසා බැලීමය. ඊට අමතරව භික්ෂුණී පර්ෂදයේ පරිහානියට බලපෑ හේතු විමසා බැලීමත් මෙන්ම සාරධර්මවලින් සුපොහොසත්, යුක්ති සහගත හා ගුණගරුක, බෞද්ධාගමික සමාජයක් බිහිකරලීම උදෙසා භික්ෂුණී පර්ෂදය නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීම මගින් ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ අධ්‍යයනය කිරීමත්ය.

පූර්වෝක්ත අරමුණු සාධනය කරගැනීම සඳහා අනුගමනය කරන පර්යේෂණ ක්‍රමවේදය වනුයේ මහාවංසය, දීපවංසය, සිංහල ථූපවංසය ආදි ප්‍රාථමික මූලාශ්‍ර හා භික්ෂුණී වංශය, භික්ෂුණී ශාසනය ආදී ද්විතීක මූලාශ්‍රත් ප්‍රස්තුත මාතෘකාවට අදාළව මෙතෙක් ලියා පළ කරන ලද ලිපි ලේඛන ආදිය ඒකරාශී කරමින් විචාරයට බඳුන් කිරීමත් හා සම්මුඛ සාකච්ඡා තුළින් තොරතුරු ලබා ගැනීමත්ය.

මෙලෙස පර්යේෂණය කර ගෙන යාමෙන් බුදු සසුන ආරක්‍ෂා කර ගැනීමත්, බුදු දහම ව්‍යාප්ත කරලීම උදෙසාත් භික්ෂුණී පර්ෂදය පිහිටවීමෙන් සුවිශේෂී දායකත්වයක් ලබා දුන්නේය යන අනුමිතියට එළඹිය හැකිවේ. එසේම ශ්‍රී ලාංකේය බෞද්ධ කාන්තාවක් නිර්මාණය වීමේ මූලික පසුබිම සංඝමිත්තා රහත් තෙරණින් වහන්සේගේ ආගමනයෙන් සිදුවීම ද වැදගත් ඓතිහාසික සිදුවීමකි. සංඝමිත්තා තෙරණිය යටතේ පැවිදිභාවයට පත් අනුලා දේවිය ප්‍රමුඛ කාන්තාවන් නිසා ශ්‍රී ලාංකේය සමාජය තුළ කාන්තාවට ගෞරවණීය ස්ථානයක් හිමිවීම ද වැදගත් වේ. භික්ෂුණී පර්ෂදයේ ව්‍යාප්තිය පිළිබඳ සඳහන් කිරීමේදී එහි වැඩීම සඳහා රාජකීය කාන්තාවන් හා ප්‍රභූ කාන්තාවන් පැවිදි දිවියට ඇතුළත්වීම මහත් රුකුලක් විය. නිදසුන් ලෙස දුටුගැමුණු රජුගේ සෙනෙවියකුගේ දියණියක වූ නාගා කුමරිය, කාවන්තිස්ස රජුගේ දියණිවරුන් වූ මහීලා හා සමන්තා, එසේම කාවන්තිස්ස රජුගේ ම පුරෝහිත බමුණාගේ දියණිවරුන් වූ දාසි, ගිරිකාලි, සුබ්බපාසිකා, සංඛපාලි යන මෙහෙණිවරුන් එකල භික්ෂුණී ශාසනයට ඇතුළත්ව කටයුතු කළ බැව් දීපවංසයේ සඳහන් වේ. එසේම සාමාන්‍ය ගැමි කාන්තාවගේ සිට රාජ මහාමාත්‍ය පවුල්වල කාන්තාවන් ද දන්දීම, සිල්රැකීම ආදී ආගමික කාර්යන්හි නිරත වෙමින් ලෙන් විහාර ඉදිකිරීම හා නඩත්තු කිරීම යනාදී කාර්යයන්ට සහය දක්වමින් පොදුවේ බෞද්ධ කාන්තාවක් වශයෙන් බෞද්ධාගම ව්‍යාප්ත කරලීම උදෙසා සුවිශාල කාර්යභාරයක් සිදු කරන ලදී. තත්කාලීන ජන ජීවිතය පිළිබඳව තොරතුරු ලබා ගත හැකි මූලාශ්‍රයක් වන රසවාහිනියේ මෙලෙස දන්දීම,



UNIVERSITY OF SRI LANKA 07 APR 2015

සිල්රැකීම, ආදී ආගමික කාර්යන්හි නිරත වූ කාන්තාවන් පිළිබඳ තොරතුරු රැසක් අන්තර්ගතය. නිදසුන් ලෙස නාගාය කථා වස්තුව (නාගා නම් දාසියක විසින් කහවණු සැටක් ණයට ගෙන පිණ්ඩපාතයේ වැඩි භික්ෂූන් වහන්සේ සැට නමකට දානය දීම) දැක්විය හැකිය. විශේෂයෙන් ක්‍රි.පූ. තුන්වන සියවසේ සිට ක්‍රි.ව. පළවන සියවස දක්වා සැලකිය යුතු ප්‍රමාණයකට ලෙන් පූජා කළ සමාජයේ විවිධ තරාතිරම්වලට අයත් වූ කාන්තාවන් පිළිබඳව මූලාශ්‍රගත තොරතුරු ඇසුරින් ලබා ගත හැකිය. නිදසුන් ලෙස 'මහරජහ ගාමිණී තිස්ස රජුගේ භාර්යාව වූ උපාසික කිටකය ලෙන සංඝයාට', 'ගාමණී උති මහරජුගේ දුව වූ තිස්සා කුමරියගේ ලෙන දස දිශාවේ සංඝයාට' ආදී සෙල්ලිපි පාඨ දැක්විය හැකිය. වෙහෙර විහාර ඉදිකිරීම ආදියෙහි ද නියැලුණු කාන්තාවන් ගැන තොරතුරු මූලාශ්‍රගත තොරතුරු ඇසුරින් ලබා ගත හැකිය. වෙහෙර විහාර බොහොමයක් ඉදිකොට සංඝයාට පූජා කිරීම් වැඩි වශයෙන් සිදු කර ඇත්තේ රාජකීය හා ප්‍රභූ කාන්තාවන් විසිනි. ඒ අතර වසභ රජුගේ බිසව වූ මෙත්තා දේවිය විසින් 'වෘත්ත' නම් සෑයක් සහ සෑ ගෙයක් මහබෝධි මළුවේ කරවූ බව මහාවංසයේ සඳහන් වේ. එසේම දෙවන දප්පුල රජුගේ බිසව විසින් සෑ ගිරියේ කටුසෑය, ඉදි කර භික්ෂුණීන්ට සපයා දීමත් දෙවන සේන රජුගේ බිසව වූ සංගා තෙරණිය විසින් සංඝසේන විහාරය ඉදි කළ බැව් මහාවංසයේ වන සඳහනත් වැදගත්ය. නමුත් පොළොන්නරු යුගයෙන් පසුව මෙම තත්ත්වය ක්‍රමිකව පරිහානියට පත්වූ අතර වර්තමානයේදී ද එම තත්ත්වය දැකගත හැකිය. එහෙත් වර්තමානයේ වුවද ඇතැම් ග්‍රාමීය ප්‍රදේශවල පුරාතන භික්ෂුණීන් අනුගමනය කරමින් ආරාමගත ව බණ භාවනා ආදිය කරමින් සිටින 'සිල් මැණිවරු' හෝ 'දසසිල් මාතාවෝ' හෝ 'සිල් මාතාවෝ' යන නම්වලින් හඳුන්වන අතළොස්සක් පමණ පිරිසක් සිටිනු දැකගත හැකිය. එහෙත් භික්ෂුණී පර්ෂදයක් නොමැතිවීම හේතුවෙන් මෙම පිරිසට අතීත සමාජයේ භික්ෂුණියට හිමිවූ තත්ත්වය නොලැබී තිබේ. මේ සඳහා හේතු සාධක රැසක් බලපා ඇති බව පෙනේ. එනමුත් නැවත ශ්‍රී ලංකාව තුළ භික්ෂුණී පර්ෂදය යළි ප්‍රතිෂ්ඨාපනය කරලීමටත් එහි ව්‍යාප්තිය සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබා දීමත් මගින් කාන්තාවගේ විමුක්තිය පමණක් නොව සමාජ විමුක්තිය ද නැවත ස්ථාපිත කරලිය හැකි බවත් අතීතයේදී මෙන් කාන්තාවන් නැවත ආගමික කර්තව්‍යයන් සඳහා යොමු කරවීම මගින් පන්සිල් සුරකින සාරධර්මවලින් සුපොහොසත්, යුක්ති සහගත හා ගුණගරුක ජීවන රටාවක් ගත කරන සමාජයක් බිහිකරලිය හැකිය යන අනුමිතියට ද මෙමගින් එළඹිය හැකිය. අතීතයේ පැවති භික්ෂුණී පර්ෂදය නැවත ශක්තිමත් අන්දමින් ගොඩනැගීමත් ඒ ඔස්සේ විවිධ ආගමික වැඩසටහන්, සමාජ සත්කාර ක්‍රියා, මිනිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් හා උපදේශන සේවා වැනි වැඩසටහන් ග්‍රාමීය මට්ටමින් මෙන්ම ප්‍රාදේශීය මට්ටමිනුත් දීපව්‍යාප්ත මට්ටමිනුත් ක්‍රියාත්මක කිරීම මගින් අතීතයේ පැවතියා මෙන් බෞද්ධාගමික සමාජයක් බිහිකරලිය හැකි බව මෙම පර්යේෂණය කරගෙන යාමේදී පෙනී යන කරුණකි. විශේෂයෙන්

කාන්තාවන්ට ඇති වන ගැටලු භික්ෂූන් වහන්සේලාට ඉදිරිපත් කිරීමට අපහසු අවස්ථාවල ඒවා භික්ෂුණීන් වහන්සේ මගින් විසඳා ගැනීමට හැකි නිසා භික්ෂුණී පර්ෂදයේ වැදගත්කම කොතෙක් දැයි කිව නොහැකිය. එබැවින් බුදු සසුන කෙරෙහි කාන්තා සම්බන්ධය වැඩිවීමට භික්ෂුණීන් වහන්සේගේ ශාසනික මෙහෙවර මහත් සේ උපකාරී වනු ඇත.

**ප්‍රමුඛ පදඃ** භික්ෂුණී පර්ෂදය, බෞද්ධ කාන්තාව, මූලාශ්‍ර, සමාජ ඉතිහාසය

**ආශ්‍රිත ග්‍රන්ථඃ**

*දීපවංසය,* (1970). (සංස්.) කිරිඇල්ලේ ඤාණවිමල හිමි, කොළඹඃ ඇම්.ඩී.ගුණසේන සහ සමාගම.

*මහාවංසය* (ප්‍රථම භාගය). (1952). (සංස්.) හික්කඩුවේ සුමංගල හිමි හා දොන් අන්ද්‍රියස්ද සිල්වා බටුවන්තුඩාවේ. කොළඹඃ ආණ්ඩුවේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව.

*Inscriptions of Ceylon* Vol.1, (1970). (ed.) S. Paranavitana, Colombo: Department of Archaeology.

වංගීස හිමි, ඌරුගමුවේ. (1986). *භික්ෂුණී ශාසනය.* දෙහිවලඃ මාකඳුරේ සිරිසුමන ප්‍රකාශකයෝ.

සෙනවිරත්න, අනුරාධ. (2003). *ලක්දිව බුදු සසුන හා සිංහල සංස්කෘතිය.* කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.